# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1076/1 – 1999 අප්‍රේල් 19 වැනි සඳුදා – 1999.04.19**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය – සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 21/78 iv.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24(අ) වගන්තිය සමග කියවිය යුතු 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය යි.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1999 අප්‍රේල් මස 09 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 1999 අංක 1 දරන ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 1999 අප්‍රේල් මස 20 වැනි දින දී ක්‍රියාත්මක විය යුතු ය.

2. මේ නියමාවලිය (මෙහි මින් මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24(අ) වගන්තිය යටතේ (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් 1998 ඔක්තෝබර් මස 21 වැනි දින දරන නියමය මගින් පිහිටුවනු ලැබූ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයට අදාළ විය යුතුය.

3. (මෙහි මින් මතු "විශ්වවිද්‍යාලය" යනුවෙන් හඳුන්වනු ලබන) ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයට මේ ආයතනය අනුයුක්ත විය යුතුය.

4. පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට සහ (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍යවලට යටත්ව පහත සඳහන් කටයුතු කිරීමට බලය ඇත්තේය.

(අ) ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම ;

(ආ) ආයතනයේ හා විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පුස්තකාල හා විඥාපන විද්‍යා පිළිබඳ යම්තාක් වූ අංශවල අධ්‍යාපනය, පුහුණුව හා පර්යේෂණ සඳහා විධිවිධාන සැළැස්වීම ;

1A–H 2971–900 (99/04)
සැ.යු.- අති විශෙෂ ගැසට් අංක 1075/1 දරන ගැසට් කාණ්ඩය අංක 1075/11න් අවසන් වේ.

(ඇ) විශ්ව විද්‍යාලයේ අනුමතය සහ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව පුස්තකාල හා විඥාපන විද්‍යා විෂයයෙහි ප්‍රදානය කළ යුතු පශ්චාත් උපාධි අභිඥාන පත්‍ර, සහතික පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා නිශ්චය කිරීම ;

(ඈ) පුස්තකාල හා විඥාපන විද්‍යා පිළිබඳ ප්‍රවීනත්වය ලැබූ තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්ය සඳහා විශ්ව විද්‍යාලයේ අනුමැතිය ඇතිව පශ්චාත් උපාධි සඳහා විභාග පැවැත්වීම සහ ඒ විභාගවලින් සාමාර්ථය ලබා ගැනීමෙන් ද ආයතනය විමසීමෙන් පසු විශ්ව විද්‍යාලය විසින් සාදනු ලබන අතුරු ව්‍යවස්ථා මගින් පනවනු ලැබූ වෙනත් කොන්දේසි සපුරාලීමෙන් ද විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීමට සුදුසු තැනැත්තන් විශ්ව විද්‍යාලය වෙත නිර්දේශ කිරීම ;

(ඉ) ආයතනයේ පරමාර්ථවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශීය විශ්ව විද්‍යාල හෝ ආයතන සමග ආචාර්යවරුන්, ශිෂ්‍යයන් හා ශාස්ත්‍රධරයන් හුවමාරු කර ගැනීමේ හෝ අන්‍යාකාරයකින් සහයෝගයෙන් ක්‍රියා කිරීම ;

(ඊ) අතුරු ව්‍යවස්ථාවකින් නියම කරනු ලැබිය හැකි පරිදි, ආයතනයට ඇතුල්වීමට අපේක්ෂා කරන තැනැත්තන් විසින් විශ්වවිද්‍යාලවල දී සහ විශ්වවිද්‍යාල තත්ත්වයේ අධ්‍යාපන ආයතනවලදී සාමාර්ථය ලත් විභාග හා ගත කළ අධ්‍යයන කාල සීමාව හෝ ලබන ලද ඉගෙනුම ආයතනයේ එවැනි විභාගවලට හා එවැනි අධ්‍යයන කාල සීමාවලට හෝ ඉගෙනුමට නැතහොත් ඉන් යම් කොටසකට සමාන ලෙස පිළිගනු ලැබීමට සහ ඒ පිළිගැනීම කවර වුවද අවස්ථාවක දී ඉවත් කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට නිර්දේශ කිරීම ;

(උ) ආයතනයේ කාර්ය සඳහා ඉගැන්වීමේ පුහුණු කිරීමේ හෝ පර්යේෂණ කටයුතු උදෙසා පුස්තකාල හා වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම හා ඒවා පවත්වාගෙන යාම ;

(ඌ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ආචාර්ය, පරිපාලන සහ වෙනත් තනතුරු ඇති කිරීම අහෝසි කිරීම හෝ අත්හිටුවීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(එ) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ප්‍රදර්ශන, ඡාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග ඇති කිරීම හා ප්‍රදානය කිරීම

(ඒ) අධ්‍යයන පාඨමාලා හෝ එවැනි අධ්‍යයන පාඨමාලාවල කොටස් ආයතනයෙන් බාහිර වූ ස්ථානවල පැවැත්වීමට කටයුතු, ඒ සඳහා විධිවිධාන සලස්වන අතුරු ව්‍යවස්ථා අනුව, පිළියෙල කිරීම ;

(ඔ) ගාස්තු ඉල්ලීම හා භාර ගැනීම සඳහා විධිවිධාන සලස්වන යම් රීතියකට අනුකූලව ගාස්තු ඉල්ලීම හා භාර ගැනීම ; සහ

(ඕ) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය විය හැකි, වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම

5. පහත සඳහන් තැනැත්තන් ආයතනයේ නිලධරයෝ වන්නාහ :

(i) අධ්‍යක්ෂවරයා සහ

(ii) වෙනත් යම් තනතුරක් දරන තැනැත්තකු මේ ඡේදයේ කාර්ය සඳහා නිලධරයකු බව නියමාවලිය මගින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ ද එකී තනතුර දරන තැනැත්තා :-

6. (1) මේ නියමාවලිය බලාත්මකවීම ආරම්භ වූ විට, කොමිෂන් සභාව විසින් ආයතනයේ ප්‍රථම අධ්‍යක්ෂවරයා පත් කළ යුතුය. ඉන් පසුව සෑම අධ්‍යක්ෂවරයෙකු ම, ආයතනයේ කළමණාකරණ මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන, පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂෙත්‍රයෙහි ප්‍රවීනතාවයක් ඇති තිදෙනෙකුගෙන් යුතු මූල මණ්ඩලයකින් කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබිය යුතුය. එසේ වුව ද කිසිම තැනැත්තකු අනුගාමී ධූර කාලසීමා දෙකකට වඩා ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස පත් නොකළ යුතුය.

(2) එක් එක් අධ්‍යක්ෂවරයා ඔහු කලින් ධූරය අත්හැර ගියහොත් හෝ (3) වන අනුජේදය යටතේ ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට ගණන් ගනු ලබන වර්ෂ තුනක කාලසීමාවක් හෝ ඔහුට හැට පස්වන විය සම්පූර්ණ වන තෙක් හෝ යන මේ දෙකින් කලින් එළඹෙන අවස්ථාව තෙක් ඔහු ධූරය දැරිය යුතුය.

(3) දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කර ගැනීමේ කාර්ය සඳහා කැඳවනු ලබන කළමනාකරණ මණ්ඩලයේ විශේෂ රැස්වීමක දී කළමනාකරණ මණ්ඩලයේ සාමජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක ගේ ඡන්දයෙන් සම්මත කර ගනු ලබන දෝෂාරෝපණ යෝජනාවක් අනුව කළමනාකරණ මණ්ඩලයේ නිදේශය මත කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් අධ්‍යක්ෂවරයා ධූරයෙන් ඉවත් කරනු ලැබිය යුතුය. එවැනි විශේෂ රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයන් විසින් අධ්‍යක්ෂවරයා නොවන යම් සාමාජිකයකු, ඒ විශේෂ රැස්වීමේ මූලාසනය දැරීමට තෝරාපත් කර ගත යුතුය.

(4) ධූරයෙන් ඉල්ලා අස්වන හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබූ අධ්‍යක්ෂවරයා ඔහු අධ්‍යක්ෂවරයා ලෙස පත් කිරීමට පෙරාතුවම උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකුව සිටියේ නම්, ඔහු හැට පස්වන විය සම්පූර්ණ කොට නොමැතිනම්, එකී උසස් අධ්‍යාපන ආයතනයේ තමා දැරූ නිත්‍ය තනතුරට පෙරලා පැමිණිය හැකි ය.

(5) රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් නිසා තම ධුරයේ කටයුතු ඉටු කිරීමට අධ්‍යක්ෂවරයාට තාවකාලිකව නොහැකි වුවහොත්, එසේ කටයුතු කිරීමට නොහැකි වූ දින සිට දින හතක් ඇතුළත අධ්‍යක්ෂ ධුරයේ කටයුතු කිරීම සඳහා සුදුසු යයි කොමිෂන් සභාවට හැඟෙන වැඩ පිළිවෙලක් කොමිෂන් සභාව විසින් යොදනු ලැබිය යුතුය. ඒ වැඩ පිළිවෙල යොදන තෙක් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා විසින් ඒ ධුරයේ එදිනෙදා කටයුතු කරගෙන යා යුතුය.

(6) අධ්‍යක්ෂ ධුරයෙහි යම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, ඒ පුරප්පාඩුව ඇති වීමෙන් පසුව (1) වන අනුඡේදය යටතේ ස්ථිර පත්වීමක් කරන තුරු කොමිෂන් සභාව විසින් සුදුසු යයි හැඟෙන වැඩ පිළිවෙලක් යෙදිය යුතුය. ඒ වැඩ පිළිවෙල යොදන තෙක් විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා විසින් ඒ ධුරයේ එදිනෙදා කටයුතු කරගෙන යා යුතුය.

7. (1) අධ්‍යක්ෂවරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා සහ ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා වන්නේය. ඔහු නිල බලයෙන් ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු සහ නිල බලයෙන් ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයෙකු වන්නේ ය. ආයතනයේ වෙනත් යම් බලමණ්ඩලයක හෝ මණ්ඩලයක යම් රැස්වීමකට පැමිණ සිටීමට හා එය ඇමතීමටද ඔහුට හිමිකම ඇති නමුත් ඒ වෙනත් යම් බලමණ්ඩලයේ හෝ මණ්ඩලයේ ඔහු සාමාජිකයකු වන්නේ නම් මිස, එකී යම් රැස්වීමක දී ඡන්දය දීමට හිමිකම් නැත්තේ ය.

(2) කළමනාකරණ මණ්ඩලය විසින් තත් කාර්ය සම්බන්ධයෙන් කලින් කල නිත්‍යානුකූලව තමා වෙත නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුකූලව ආයතනයට අදාළවනතාක් දුරට මේ නියමාවලියෙහි හා යම් උචිත සාධන පත්‍රයක ඇති විධිවිධාන යථා පරිදි පිළිපැදීම ගැන වගබලා ගැනීම අධ්‍යක්ෂවරයා ගේ කාර්යය වන්නේ ය. තව ද ඒ කාර්යය සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සළකනු ලබන යම් තාක් වූ සියලු බලතල ඔහුට ඇති අතර, ඔහුට ඒ බලතල ක්‍රියාත්මක කළ හැකිය.

(3) කළමනාකරණ මණ්ඩලයේ සහ එක් එක් ශාස්ත්‍රීය කමිටුවල තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ඒවා ක්‍රියාත්මක වන බවට වග බලා ගැනීම අධ්‍යක්ෂවරයා ගේ කාර්යය විය යුතුය.

(4) ආයතනයේ ගණන් දීමේ නිලධරයා අධ්‍යක්ෂවරයා විය යුතුය.

(5) ආයතනය තුළ විනය පවත්වා ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා වගකිව යුතුය.

8. ආයතනයේ බල මණ්ඩල පහත දැක්වේ.

(i) කළමනාකරණ මණ්ඩලය;

(ii) ශාස්ත්‍රීය කමිටු ; සහ

(iii) කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන එවැනි වෙනත් මණ්ඩල

9. (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලය ආයතනයේ ශාස්ත්‍රීය හා විධායක මණ්ඩලය විය යුතු අතර, එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය :-

(i) පහත සඳහන් නිලබලයෙන් පත්වන සාමාජිකයන්, එනම් –

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයා ;

(ඇ) විද්‍යා හා තාක්ෂණය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයා ;

(ඈ) 1984 අංක 10 දරන ශ්‍රී ලංකා පරිගණක සහ තොරතුරු තාක්ෂණවේද සභාව පනතින් පිහිටුවන ලද පරිගණක සහ තොරතුරු තාක්ෂණවේද සභාවේ (සිනටෙක්) සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයා ;

(ඉ) කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ පීඨාධිපති ;

(ඊ) 1970 අංක 17 දරන ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා ;

(උ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපතිවරයා ; සහ

(ඌ) අන්තර් විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපති කමිටුවේ සභාපතිවරයා ;

(2) පහත සඳහන් වෙනත් සාමාජිකයන්, එනම්–

(අ) අන්තර් විශ්වවිද්‍යාල පුස්තකාල කමිටුව (අයි.යූ.සී.එල්.) මගින් අවුරුදු දෙකක කාලයක් සඳහා තම සාමාජිකයන් අතුරෙන් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්, එසේ වුවද එවැනි තැනැත්තකු අනුගාමී කාල සීමා දෙකකට වඩා පත් නොකරනු ලැබිය යුතුය.

(ආ) අධ්‍යාපන, වෘත්තීය, විද්‍යා හෝ පරිපාලන ක්ෂෙත්‍රයන්හි විශිෂ්ඨ සේවාවක් ඉටු කළ තැනැත්තන් අතුරෙන් කොමිෂන් සභාව විසින් අවුරුදු තුනක කාලයක් සඳහා පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙක්.

10. (1) මණ්ඩලයේ සභාපතිවරයා, එහි සාමාජිකයන් විසින් ඔවුන් අතුරෙන් තෝරාපත් කර ගත යුතු අතර, ඔහු මණ්ඩලයේ සියලුම රැස්වීම්වල මූලාසනය දැරිය යුතුය. සභාපතිවරයා යම් රැස්වීමක මූලාසනය දැරීමට අපොහොසත් වන්නේ නම් ඒ රැස්වීමට පැමිණ සිටි සාමාජිකයන්ගෙන් යම් තැනැත්තකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරා පත් කර ගත යුතුය.

(2) සභාපතිවරයා, ඒ ධුරය දැරීමට තෝරා පත්කර ගනු ලැබූ දින සිට එක් අවුරුදු කාලසීමාවක් ධුරය දැරිය යුතු අතර, නැවත තෝරාපත් කර ගැනීමට සුදුසු වන්නේ ය.

(3) නම් කරනු ලැබූ හෝ පත්කර කරනු ලැබූ සාමාජිකයෙකු, ඔහු කලින් ධුරය අතහැර ගියහොත් මිස, අවස්ථාවෝචිත පරිදි, ඔහු නම් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු දෙකක හෝ අවුරුදු තුනක කාල සීමාවක් ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත නම් කිරීමකට හෝ නැවත පත්කිරීමකට සුදුස්සකු වන්නේ ය.

එසේ වුවද, යම් නම් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ සාමජිකයකු ඔහුගේ ධුර කාලය ඉකුත් වීමට පෙර ධුරය අත්හැරියහොත් ඔහුගේ අනුප්‍රාප්තිකයා කලින් තම ධුරය අත්හැරියහොත් මිස, අවස්ථාවෝචිත පරිදි ඔහු නම්කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ දිනයේ සිට තම පූර්වගාමියාගේ ධුර කාලයේ ඉකුත් නොවූ කාල සීමාව සඳහා පමණක් ධුරය දැරිය යුතුය.

එසේම තවදුරටත්, නම්කරනු ලැබූ සාමාජිකයකු මණ්ඩලයේ වූයේ යම් තනතුරක් නිසා ද, ඒ තනතුර දරන තාක් කල් ඔහු ධුරය දැරිය යුතුය.

(4) මණ්ඩලයේ නම් කළ යම් සාමාජිකයකු තම අත්සනින් අධ්‍යක්ෂවරයා වෙත අමතන ලද ලිපියක් මගින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) මණ්ඩලයේ පත් කළ යම් සාමාජිකයකු තම අත්සනින් කොමිෂන් සභාවේ සභාපතිවරයා අමතන ලද ලිපියක් මගින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) මණ්ඩලයේ පත් කළ යම් සාමාජිකයකු කලින් නිවාඩු ලබා නොගෙන මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණීමට අපොහොසත් වුවහොත්, ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් සිය ධුරය අත්හැර ගියා සේ සැළකිය යුතු අතර, 9(2) (ආ) ජේදයේ විධිවිධාන සැළකිල්ලට ගනිමින්, එයින් ඇතිවන පුරප්පාඩුව පිරවීම සඳහා යෝග්‍ය වූ තැනැත්තකු කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතුය.

(7) මණ්ඩලයේ සාමාජිකයන්ට මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු යම් පාරිශ්‍රමික හෝ දීමනා ගෙවනු ලැබිය යුතුය.

(8) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය එහි සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතුය.

(9) මණ්ඩලයට අවශ්‍ය වන කවර වුවද අවස්ථාවක රැස්විය හැකි අතර, කෙසේ වෙතත්, එය එක් එක් වර්ෂයේ අවස්ථා අටකට නොඅඩු අවස්ථා ගණනක් රැස්විය යුතුය.

(10) අවශ්‍යයයි තමා සළකන කවර අවස්ථාවක හෝ මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සංඛ්‍යාවකගෙන් ලිඛිත ඉල්ලීමක් අධ්‍යක්ෂවරයා වෙත ලැබී සතියක් ඇතුළත, අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතුය.

11. (1) පනතෙහි හෝ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, මේ නියමාවලිය මගින් ආයතනය වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ බලතල, කාර්ය හා කර්තව්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතුය.

(2)(1) වන ජේදය මගින් මණ්ඩලය වෙත පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත සඳහන් බලතල කාර්ය හා කර්තව්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතුය :-

(අ) ආයතනයේ දේපළ සහ අරමුදල් සතුව සිටීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම ;

(ආ) පනතෙහි හෝ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව ආයතනයට අදළ සියලු කරුණු විධිමත් කිරීම හා නිශ්චය කිරීම ;

(ඇ) නිශ්චිත කාර්යයන් සඳහා ආයතනයේ අභිමතය පරිදි ක්‍රියා කිරීමට සපයන ලද අරමුදල් පරිපාලනය කිරීම ;

(ඈ) අන්තිම කැමති පත්‍ර මගින් පරිත්‍යාග මගින් හෝ වෙනත් ප්‍රදාන මගින් ආයතනය වෙත කරනු ලබන දේපළ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව භාර ගැනීම හා පිළිගැනීම ;

(ඉ) ආයතනයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම් සළකා බැලීම සහ ඒ වාර්තාව හා ගිණුම් විශ්වවිද්‍යාලය හා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(ඊ) ආයතනයේ මුදල් ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ඒ ඇස්තමේන්තු විශ්වවිද්‍යාලය සහ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(ඨ) පුස්තකාල හා විඥාපන විද්‍යා සම්බන්ධයෙන් ප්‍රදානය කළ යුතු පශ්චාත් උපාධි, අභිඥන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ද එවැනි උපාධි, අභිඥන පත්‍ර සහතික පත්‍ර වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සඳහා සුදුසුකම් ලබාගැනීමට අපේක්ෂා කරන ශිෂ්‍යයන් විසින් හැදෑරිය යුතු අධ්‍යායන පාඨමාලා හා ලැබිය යුතු සාමාර්ථය ලැබිය යුතු පුහුණුව ද විභාග හා සපුරාලිය යුතු වෙනත් කොන්දේසි ද පිළිබඳව ශාස්ත්‍රීය කමිටුව විමසා විශ්වවිද්‍යාලය වෙත නිර්දේශ කිරීම ;

(ඩ) අතුරු ව්‍යවස්ථා සෑදීමට බලය දී ඇති යම් කරුණක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කර, ඒ කෙටුම්පත් නීති ගත කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ පාලක සභාව වෙත ඉදිරිපත් කිරීම ;

එසේ වුවද ශාස්ත්‍රීය කමිටුවේ වාර්තා සලකා බැලීමෙන් පසුව මිස, අධ්‍යාන පාඨමාලා හා විභාග සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් නොකල යුතුය.

(ඪ) රීති සෑදීමට බලය දී ඇත්තේ යම් කාරණයක් සම්බන්ධයෙන් ද ඒ කාරණ සඳහා රීති සෑදීම සහ ඒ රීති පැනවීම සඳහා ඒ රීතිවල කෙටුම්පත් අවස්ථාවෝචිත පරිදි විශ්ව විද්‍යාල පාලක සභාවට හෝ සනාතන සභාවට ඉදිරිපත් කිරීම ;

(ඒ) ශාස්ත්‍රීය කමිටුවේ වාර්තා සලකා බැලීමෙන් පසු අධ්‍යයන පාඨමාලා සහ විභාගවලට අදාල නියෝග කෙටුම්පත් කිරීම සහ ඒ කෙටුම්පත විශ්වවිද්‍යාලයේ සනාතන සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(ඔ) ආයතනයේ කටයුතු පවත්වා ගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය ගොඩනැගිලි, පරිශ්‍ර, ලී බඩු, උපකරණ සහ වෙනත් ද්‍රව්‍ය සැපයීම ;

(ඕ) (1) ආයතනයේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය ආචාර්ය තනතුරු පරිපාලන තනතුරු සහ වෙනත් තනතුරු ඇති කිරීම සහ ඒ තනතුරු අහෝසි කිරීම හෝ අත්හිටවීම ; සහ

(2) ආයතනයට පත් කල යුතු ආචාර්යවරුන්, නිලධරයන් හා වෙනත් සේවා නියුක්තයන් සඳහා අවශ්‍ය සුදුසුකම්, සම්බන්ධයෙන් කොමිෂන් සභාවට නිර්දේශ කිරීම ;

(ක) ආයතනයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ සේවය තාවකාලිකව නතර කිරීම ඔවුන් සේවයෙන් පහකිරීම හෝ ඔවුන්ට අන්‍යාකාරයකින් දඩුවම් කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(ග) ආයතනයේ පරීක්ෂකයන් වශයෙන් පත්කිරීම සඳහා සුදුසු වූ තැනැත්තන් පිළිබඳව විශ්ව විද්‍යාලයේ පාලක සභාවට නිර්දේශ කිරීම ;

(ච) ආයතනයේ අධ්‍යායන පාඨමාලාවලට ශිෂ්‍යයන් ඇතුළත් කිරීම සඳහා වූ නියමයන්, ශාස්ත්‍රීය කමිටුව විමසා, විශ්ව විද්‍යාලයේ සහ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව නිශ්චිත කිරීම ;

(ජ) ප්‍රයෝජනයට නොගත් යම් ආදයමක් ද ඇතුළුව ආයතනයට අයත් කවර මුදලක් වුවද භාර ආඥාපනතේ 20 වන වගන්තියේ හෝ වෙනත් ලිඛිත නීතියක හෝ විධිවිධාන යටතේ භාරකාර මුදල් නිත්‍යානුකූලව ආයෝජනය කල හැකි යම් සුරකුම්පතක ආයෝජනය කිරීම නැතහොත්, කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළක් මිළයට ගැනීම සඳහා එවැනි යම් මුදලක් ආයෝජනය කිරීම හෝ ආයතනයේ කටයුතු සඳහා වහාම අවශ්‍ය නොවූ ඒ මුදල් වලින් යම් කොටසක් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන යම් බැංකුවක ස්ථාවර ගිණුමක තැන්පත් කිරීම ;

(ට) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මේ පනතෙහි හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයක හෝ අන්‍යාකාර විධිවිධාන සළස්වා නොමැති ආයතනයේ සියලු බලතල ක්‍රියාත්මක කිරීම ;

එසේ වුවද ශාස්ත්‍රීය කමිටුවේ මතය මණ්ඩලය වෙත වාර්තා කිරීමේ හා යැවීමේ අවස්ථාවක් ශාස්ත්‍රීය කමිටුවට ප්‍රථමයෙන් දී ඇත්තේ නම් මිස යම් අධ්‍යයන කාරණයක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කිසිම යෝජනාවක් සම්මත කර නොගත යුතුය.

එසේම තවදුරටත් විශ්වවිද්‍යාලයේ එකඟත්වය නොමැතිව එසේ සම්මත කරගන්නා ලද යෝජනාවක් මත කටයුතු නොකල යුතුය.

මේ වගන්තියෙහි "අධ්‍යයන කාරණය" යන්නෙන් ශාස්ත්‍රීය කමිටුවේ පාලනයට හා සාමාන්‍ය විධානයට යටත් යම් කාරණයක් අදහස් වේ.

12. (1) පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත ශාස්ත්‍රීය කමිටුවක් තිබිය යුතුය :-

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) ආයතනයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය ;

(ඇ) පනත යටතේ පිහිටුවනු ලැබුවා වූ හෝ පිහිටුවන ලදැයි සළකනු ලබන්නා වූ විශ්වවිද්‍යාලවල එක් එක් පුස්තකාල හා විඥාපන විද්‍යා අංශයේ ප්‍රධානියා ;

(ඈ) ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ නියෝජිතයෙක් ;

(ඉ) ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සංගමයේ නියෝජිතයෙක් ;

(ඊ) අන්තර් විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපති කමිටුවේ සාමාජිකයන් අතුරෙන් අවුරුදු දෙකක කාල සීමාවක් සඳහා ඔවුන් විසින් නම්කරනු ලැබූ පුස්තකාලයාධිපතීන් දෙදෙනෙක් ;

එසේ වුවද, එවැනි තැනැත්තන් අනුක්‍රමික ධූර කාල දෙකකට වැඩි ගණනකට නම් කරනු නොලැබිය යුතුය.

(උ) විඥපන තාක්ෂණවේද විෂය ක්ෂේත්‍රයේ වෘත්තිකයන් දෙදෙනෙකු ඇතුළත්ව කළමනාකරණ මණ්ඩලය විසින් අවුරුදු තුනක කාලයක් සඳහා පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙක්.

(2) යම් නිශ්චිත කාර්යයක් සඳහා යම් නිශ්චිත කාලයකට එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව කවර වුවද ශාස්ත්‍රීය කමිටුවක් විසින් එහි සාමාජිකයකු ලෙස ඊට එකතු කරගනු ලැබිය හැකිය. එහෙත් එසේ එකතු කර ගනු ලැබූ කවර වුවද තැනැත්තකුට ඒ ශාස්ත්‍රීය කමිටුවට ඡන්දයෙන් පත්වීම සඳහා ඉදිරිපත්වීම හෝ, ඒ කමිටුවේ යම් රැස්වීමක දී ඡන්දය දීමේ හෝ අයිතියක් නැත්තේ ය.

(3) නම් කරනු ලැබූ හෝ පත්කරනු ලැබූ සාමාජිකයකු ඔහු කලින් ධූරය අත්හරිනු ලැබුවහොත් මිස අවස්ථාවෝචිත පරිදි ඔහු නම් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ දින පටන් ගණන් බලන ලද අවුරුදු දෙකක හෝ අවුරුදු තුනක කාලයක් සඳහා ධූරය දැරිය යුතු අතර, ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත නම් කිරීමට හෝ නැවත පත්කිරීමට සුදුස්සකු වන්නේ ය.

එසේ වුවද, යම් නම් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ සාමාජිකයකු සිය ධූර කාලය ඉකුත්වීමට පෙරාතුව ධූරය අත්හරිනු ලැබුවහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින්, කලින් තම ධූරය අත්හරින්නේ නම් මිස, අවස්ථාවෝචිත පරිදි ඔහු නම් කරනු ලැබූ හෝ පත්කරනු ලැබූ දින පටන් ගණන් බලන ලද, සිය පූර්වගාමියාගේ ධූරකාලයේ ඉකුත් නොවූ කාලසීමාව සඳහා පමණක් ධූරය දැරිය යුතුය.

එසේම තවදුරටත්, නම් කරනු ලැබූ සාමාජිකයකු විසින්, තමා ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයකු වූයේ යම් තනතුරක් නිසා ද ඒ තනතුර දරන තාක් කල් ඔහු ධූරය දැරිය යුතුය.

(4) ශාස්ත්‍රීය කමිටුවේ නම්කරනු ලැබූ හෝ පත්කරනු ලැබූ සාමාජිකයකු, තම අත්සන යටතේ අධ්‍යක්ෂවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් සිය ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(5) ශාස්ත්‍රීය කමිටුවේ රැස්වීමක ගණපූර්ණය, එහි එකතුකරගත් සාමාජිකයන් කිසිවකු වෙත්නම් ඔවුන් අත්හැර මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක් විය යුතුය.

(6) අවශ්‍ය කවර විටකදී වුවද ශාස්ත්‍රීය කමිටුව රැස්විය යුතු අතර කෙසේ වෙතත්, එක් අවුරුද්දක් තුළ දී අවස්ථා දහයකට නොඅඩු වාර ගණනක් රැස්විය යුතුය.

13. (1) පනතෙහි හෝ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, ආයතනයේ ඉගැන්වීම්, අධ්‍යාපනය, පර්යේෂණ හා විභාග සම්බන්ධයෙන් පාලනය හා සාමාන්‍ය විධානය ශාස්ත්‍රීය කමිටුව සතු වන්නේ ය.

(2) (1) වන අනු ඡේදය මගින් ශාස්ත්‍රීය කමිටුව වෙත පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව පහත සඳහන් බලතල කාර්ය හා කර්තව්‍ය ඒ මගින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතුය.

(අ) මණ්ඩලය විසින් යොමු කරනු ලැබූ යම් කරුණක් පිළිබඳව සළකා බැලීම හා වාර්තා කිරීම ;

(ආ) අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීමේ වැඩසටහන හෝ වැඩසටහන් හා විභාග පිළිබඳ වූ සියලු කරුණු සම්බන්ධයෙන් මණ්ඩලය වෙත නිර්දේශ හා වාර්තා ඉදිරිපත් කිරීම ;

(ඇ) යම් විශේෂ විෂයයක් හෝ විෂයයන් පිළිබඳව සලකා බලා ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීමේ කාර්යය සඳහා ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයින් නොවන තැනැත්තන් ඇතුළත් කරනු ලැබිය හැකි කමිටු පත් කිරීම ;

(ඈ) අධ්‍යයන පාඨමාලාවලට හා විභාගවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සඳහා තිබිය යුතු අවශ්‍යතා මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(ඉ) ආචාර්යවරුන් හා පරීක්ෂකයන් වශයෙන් පිළිගැනීමට සුදුසු තැනැත්තන් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(ඊ) අධ්‍යයන පාඨමාලා හා විභාග සඳහා වූ නියෝග කෙටුම්පත් කර ඒ කෙටුම්පත් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ;

(උ) නියමිත විභාග සමත් වීමෙන් ද, වෙනත් නියමිත කොන්දේසි සපුරාලීමෙන් ද අදාළ පශ්චාත් උපාධි, අභිඥන පත්‍ර, සහතික පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීමට සුදුසු තැනැත්තන් මණ්ඩලයට නිර්දේශ කිරීම ;

(ඌ) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා තරඟ කිරීමේ ක්‍රම හා කොන්දේසි මණ්ඩලයට නිර්දේශ කිරීම ;

(එ) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා සුදුසු තැනැත්තන්ගේ නම් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම.

14. ආයතනයේ මුදල් වර්ෂය ආණ්ඩුවේ මුදල් වර්ෂයම විය යුතුය.

15. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික පුස්තකාල හා විඥපන විද්‍යා ආයතන අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් ආයතනයට තිබිය යුතුය.

එම අරමුදලට පහත සඳහන් මුදල් ගෙවිය යුතුය :—

(අ) පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරන ලදුව කොමිෂන් සභාව විසින් ආයතනයට ආධාර මුදල් වශයෙන් වෙන්කරනු ලබන්නා වූ සියලුම මුදල් ;

(ආ) යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන අනුව ආයතනයට ගෙවිය යුතු වූ සියලු ගාස්තු ;

(ඇ) පරිත්‍යාග වලින් ලැබෙන සියලු ආදයම් ; සහ

(ඈ) කවර හෝ ප්‍රභවයකින් අත්කරගනු ලැබ ආයතනයට උපචිත වන්නා වූ වෙනත් මුදල් ;

(2) යම්කිසි මාසයක් තුළ අරමුදලට ගෙවනු ලැබූ සියලු මුදල් ප්‍රමාණ වල සාරාංශයක්, උචිත ආදයම් ශීර්ෂ යටතේ වර්ග කර, ඊළඟ මාසය අවසන් වීමට පෙර කොමිෂන් සභාවේ දැන ගැනීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුය.

16. අධ්‍යක්ෂවරයාගේ කාර්යය විය යුත්තේ :-

(අ) මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියක හා ආකාරයට ආයතනයේ ගිණුම් තැබීම ;

(ආ) අරමුදලට ගෙවනු ලබන සියලුම මුදල් ලබා ගැනීම සහ ඒ මුදල් නියමිත ගිණුම් ශීර්ෂයන්ට බැර කිරීම ;

(ඇ) බලය දෙනු ලැබූ සියලු ගෙවීම් කිරීම ; සහ

(ඈ) කොමිෂන් සභාවට අවශ්‍යවන ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු හා ඉදිරි මුදල් වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය විසර්ජන මණ්ඩලය සඳහා පිළියෙල කිරීම.

එසේ වුවද, විශේෂිත කාර්යය සඳහා ප්‍රදනයන් ගෙන් හෝ විශේෂිත පරමාර්ථ සඳහා වූ පරිත්‍යාගයන්ගෙන් ලැබුණු ආදයම ආයතනයේ ගිණුම් වල වෙන් වෙන්ව ගිණුම් ගත කළ යුතු අතර, ආයතනයේ සාමාන්‍ය කාර්ය සඳහා හෝ පිළිවෙලින් එවැනි ප්‍රදන හෝ පරිත්‍යාග කරනු ලැබූ යම් කාර්යය හෝ පරමාර්ථ වලින් බැහැර වූ යම් කාර්යය හෝ පරමාර්ථ සඳහා හෝ එවැනි ආදයමෙන් ගෙවීම් නොකළ යුතුය.

17. (1) කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන පිළිවෙලට හා ආකාරයට සහ එසේ නියම කරනු ලැබූ විස්තර ඇතුළත් කොට ආයතනයේ කටයුතු වලට අදාළ වාර්ෂික ගිණුම් හා සංඛ්‍යා ලේඛන පිළිබඳ ප්‍රකාශයක් ආයතනය විසින් පිළියෙල කළ යුතුය.

(2) ආයතනයේ ගිණුම් පොත් ආයතන කාර්යාලයේ තැබිය යුතුය.

18. (1) ආයතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි විශ්ව විද්‍යාලයේ එකඟත්වය සහ කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව ආයතනය විසින් සලකනු ලබන නිලධරයන්, ආචාර්යවරුන් සහ වෙනත් සේවා නියුක්තකයන්ගෙන් ආයතනයේ කාර්ය මණ්ඩලය සමන්විත විය යුතුය.

(2) ආයතනයේ කාර්ය මණ්ඩලය, අවස්ථාවෝචිත පරිදි, විශ්ව විද්‍යාලය විසින් ස්වකීය කාර්ය මණ්ඩලයෙන් මුදා හැරීමෙන් හෝ කොමිෂන් සභාව හෝ විශ්ව විද්‍යාලය විසින් පත් කිරීමෙන් ලබා දිය යුතුය.

(3) විශ්ව විද්‍යාලයේ නිලධරයකු, ආචාර්යවරයකු හෝ වෙනත් සේවා නියුක්තිකයකු ආයතනයේ සේවය සඳහා පූර්ණ කාලීන පදනමකක් මත මුදා හරිනු ලැබූ විටෙක, ආයතනය විසින් විශ්ව විද්‍යාලයේ ඔහුගේ ස්ථිර තනතුරෙහි වැටුප හා දීමනා ඔහුට ගෙවනු ලැබිය යුතුය. වෙනත් යම් අවස්ථාවක දී, විශ්ව විද්‍යාලය විමසීමෙන් සහ කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව නිශ්චය කරනු ලබන යම් දීමනාවක් ආයතනය විසින් අදාළ නිලධරයාට, ආචාර්යවරයාට හෝ වෙනත් සේවා නියුක්තයාට ගෙවනු ලැබිය හැකිය.

(4) ආයතනයේ කාර්යය මණ්ඩලය අධ්‍යක්ෂවරයා ගේ විධානයට හා විනය පාලනයට යටත් විය යුතුය.

19. ආයතනයේ යම් බල මණ්ඩලයකට හෝ වෙනත් මණ්ඩලයකට යම් තැනැත්තකු යථා පරිදි තෝරා පත් කර ගනු ලැබී ද, පත්කර ගනු ලැබී ද, නම් කරනු ලැබී ද, අතිරේකව යොදනු ලැබී ද, නැතහොත් ඔහු ඒ බල මණ්ඩලයේ හෝ වෙනත් මණ්ඩලයක හෝ සාමාජිකයෙකුව සිටීමට හිමිකම් ලබා තිබේ ද යන්න ගැන යම් සැකයක් පැන නැගුනහොත් එම කාරණය කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු අතර, ඒ පිළිබඳව කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන්නේ ය.

20. මෙම නියමාවලිය ක්‍රියාත්මක වීමෙන් ඉක්බිතිව පුස්තකාල හා විඥපන විද්‍යා පිළිබඳ පශ්චාත් උපාධි, අභිඥන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රී විශිෂ්ඨතා ප්‍රදානය කිරීම ආයතනයේ නිර්දේශ මත විශ්ව විද්‍යාලය විසින් කරනු ලැබිය යුතුය.

එසේ වුවද පුස්තකාල, වෘත්තීය මණ්ඩල විසින් කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, ආයතනය සහ විශ්ව විද්‍යාලය සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් පුස්තකාල හා විඥපන පිළිබඳ එම උපාධි, අභිඥන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කළ හැකිය.

21. මේ නියමාවලියෙහි-

"උචිත සාධන පත්‍රය" යන්නට පනතේ දී ඇති අර්ථයම ඇත්තේ ය.

"කොමිෂන් සභාව" යන්නෙන් පනත යටතේ පිහිටවනු ලැබූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ.

"වෘත්තීය මණ්ඩල" යන්නෙන් පාර්ලිමේන්තු පනතක් මගින් සංස්ථාගත කරනු ලැබූ හෝ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය එවැන්නක් ලෙස පිළිගනු ලැබූ පුස්තකාල සහ විඥපන විද්‍යා ක්ෂේත්‍රයෙහි වූ සංගමයක්, විද්‍යාලයක්, මණ්ඩලයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

"විශ්ව විද්‍යාල" යන්නෙන් 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටවනු ලැබූ හෝ පිහිටවනු ලැබූ ලෙස සැළකෙන විශ්ව විද්‍යාල අදහස් වේ.

"ශ්‍රී ලංකා පුස්තකාල සංගමය" යන්නෙන් 1974 අංක 20 දරන පනත මගින් පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය අදහස් වේ.

05-07

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.